| 01. | 14291 | අංක රහිත | අංක රහිත | අංක රහිත | අබලි සී පැන් වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අත් ට්‍රැක්ටරය |
| 02. | 96688 | 28-3537 | අංක රහිත | අංක රහිත | ඉසසු වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි ලොරි රථය |
| 03. | AR/294/18 | 203-3079 | අංක රහිත | අංක රහිත | බජාජ් වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි ත්‍රීරෝද රථය |
| 04 | 12279 | අංක රහිත | 2CGB322BAFV/008774 | අංක රහිත | එම්. වී. ඔගස්ටා බ්රූටෙල් වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි බෙලි යතුරු පැදිය |
| 05. | 451/18 | BFR -7830 | MD2A18AY7HWD27179 | DUZWHD09989 | බජාජ් සී. ටී. 100 වර්ගයේ ලියාපදිංචි කළ හැකි යතුරු පැදිය |
| 06. | 5831/18 | MD-6478 | DUFBMB91960 | DUMBMB07891 | බජාජ් සී. ටී. 100 වර්ගයේ ලියාපදිංචි කළ හැකි යතුරු පැදිය |
| 07. | 86961 | LH-3489 | MAT445051AZR16982 | 275D105CZY535923 | ටාටා ඒ. සී. ඊ. වර්ගයේ ලියාපදිංචි කළ හැකි ලොරි රථය |
| 08. | 90279 | BCM-1184 | ME4JF396EF80033943 | IF39E-R-1003865 | හොන්ඩා ඩියෝ වර්ගයේ ලියාපදිංචි කළ හැකි යතුරු පැදිය |
| 09. | 65844 | TD-7667 | MD2DHDJZZNCA23647 | DJGBNA23827 | බජාජ් සල්පර් 180 වර්ගයේ ලියාපදිංචි කළ හැකි යතුරු පැදිය |
| 10. | 71052 | LG-4518 | LNJBED8128K601061 | අංක රහිත | ඉයුජින් වර්ගයේ ලියාපදිංචි කළ හැකි ලොරි රථය |
| 11. | 82302 | 48-1071 | MAT369073HIR06256 | අංක රහිත | ටාටා 1612 වර්ගයේ ලියපදිංචි කළ හැකි ලොරි රථය |
| 12. | 92646 | XI-5526 | MBLF16EDCGA09907 | JF16EBCGA09838 | හීරෝ හොන්ඩා ප්ලේෂර් වර්ගයේ ලියාපදිංචි කළ හැකි යතරු පැදිය |
| 13. | 99753 | WZ-1366 | MBLIA06ABBGG002490 0249 | JAB6EHBGG00108 | හිරෝ හොන්ඩා ග්ලැබර් වර්ගයේ ලියාපදිංචි කළ හැකි යතුරු පැදිය |
| 14. | 74846 | WP-3511 | DFFBKG16483 | අංක රහිත | බජාඞ් බොක්සර් වර්ගයේ ලියාපදිංචි කළ හැකි යතුරු පැදිය |
| 15. | 13670 | ගෑස් සිලින්ඩරය | | | |
| 16. | 13919 | ගෑස් සිලින්ඩරය | | | |
| 17. | 14940 | ගෑස් සිලින්ඩරය | | | |
| 18. | 15086 | ගෑස් සිලින්ඩරය | | | |
| 19. | 15085 | ගෑස් සිලින්ඩරය | | | |
| 20. | 15390 | ගෑස් සිලින්ඩරය | | | |
| 21. | 18133 | ගෑස් සිලින්ඩරය | | | |
| 22. | 19734/20 | ගෑස් සිලින්ඩරය | | | |
| 23. | 19752 | ගෑස් සිලින්ඩරය | | | |
| 24. | 19682 | ගෑස් සිලින්ඩරය | | | |
| 25. | 19747 | ගෑස් සිලින්ඩරය | | | |
| 26. | 9362 | ගෑස් සිලින්ඩරය | | | |
| 27. | 11173 | ගෑස් සිලින්ඩරය | | | |
| 28. | 11116 | ගෑස් සිලින්ඩරය | | | |
| 29. | 12209 | ගෑස් සිලින්ඩරය | | | |
| 30. | 12733 | ගෑස් සිලින්ඩරය | | | |
| 31. | 14220 | ගෑස් සිලින්ඩරය | | | |
| 32. | 8470 | ගෑස් සිලින්ඩරය | | | |
| 33. | 14631 | ගෑස් සිලින්ඩරය | | | |
| 34. | 15309 | ගෑස් සිලින්ඩරය | | | |
| 35. | 15367 | ගෑස් සිලින්ඩරය | | | |
| 36. | 15557 | ගෑස් සිලින්ඩරය | | | |
| 37. | 16296 | ගෑස් සිලින්ඩරය | | | |

| අනු. අංකය | නඩු අංකය | ලියාපදිංචි අංකය | වැසි අංකය | එංජින් අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|---|---|
| 38. | 1641 | ගෑස් සිලින්ඩරය | | | |
| 39. | 18579 | ගෑස් සිලින්ඩරය | | | |
| 40. | 18579 | ගෑස් සිලින්ඩරය | | | |
| 41. | 18579 | ගෑස් සිලින්ඩරය | | | |
| 42. | 18579 | ගෑස් සිලින්ඩරය | | | |
| 43. | 18579 | ගෑස් සිලින්ඩරය | | | |
| 44. | 18579 | ගෑස් සිලින්ඩරය | | | |
| 45. | 18785 | ගෑස් සිලින්ඩරය | | | |
| 46. | 18785 | ගෑස් සිලින්ඩරය | | | |
| 47. | 19231 | ගෑස් සිලින්ඩරය | | | |
| 48. | 20066 | ගෑස් සිලින්ඩරය | | | |
| 49. | 14495 | ගෑස් සිලින්ඩරය | | | |
| 50. | 13670 | ගෑස් ලිප | | | |
| 51. | 13919 | ගෑස් ලිප | | | |
| 52. | 14940 | ගෑස් ලිප | | | |
| 53. | 15086 | ගෑස් ලිප | | | |
| 54. | 15085 | ගෑස් ලිප | | | |
| 55. | 15390 | ගෑස් ලිප | | | |
| 56. | 18133 | ගෑස් ලිප | | | |
| 57. | 19734/20 | ගෑස් ලිප | | | |
| 58. | 19752 | ගෑස් ලිප | | | |
| 59. | 19682 | ගෑස් ලිප | | | |
| 60. | 19747 | ගෑස් ලිප | | | |
| 61. | 9362 | ගෑස් ලිප | | | |
| 62. | 11173 | ගෑස් ලිප | | | |
| 63. | 10026 | ගෑස් ලිප | | | |
| 64. | 11187 | ගෑස් ලිප | | | |
| 65. | 12209 | ගෑස් ලිප | | | |
| 66. | 12733 | ගෑස් ලිප | | | |
| 67. | 8470 | ගෑස් ලිප | | | |
| 68. | 14220 | ගෑස් ලිප | | | |
| 69. | 14631 | ගෑස් ලිප | | | |
| 70. | 15309 | ගෑස් ලිප | | | |
| 71. | 15367 | ගෑස් ලිප | | | |
| 72. | 15557 | ගෑස් ලිප | | | |
| 73. | 14459 | ගෑස් ලිප | | | |
| 74. | 16296 | ගෑස් ලිප | | | |
| 75. | 16641 | ගෑස් ලිප | | | |
| 76. | 18576 | ගෑස් ලිප | | | |
| 77. | 18579 | ගෑස් ලිප | | | |
| 78. | 18785 | ගෑස් ලිප | | | |
| 79. | 19231 | ගෑස් ලිප | | | |
| 80. | 20066 | ගෑස් ලිප | | | |
| 81. | 19218 | ගෑස් ලිප | | | |
| 82. | 14495 | ගෑස් ලිප | | | |

## මහෙස්ත්‍රාත් අධිකරණය - ආණමඩුව

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ආණමඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩු වලට අදාලව මෙම අධිකරණය වෙත භාර දී ඇති රාජසන්තක කරනලද, අත් ට්‍රැක්ටර් සහ ලොරි රථයක් 2020.08.01 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ දී වෙන්දේසිය පැවැත්වීමට පැයකටවත් කලින් රෙජිස්ට්‍රාර්තුමිය වෙත හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්තුමිය ගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කළ හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා එවේලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිලදී ගන්නා සියලුම භාණ්ඩ එදිනම පස්වරු. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

එච්. පී. එස්. දුලන්ගිකා ජයසිංහ,
මහෙස්ත්‍රාත්,
ආණමඩුව.

2020.07.10 වැනි දින,
ආණමඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු. අංකය* | *නඩු අංකය* | *ලි. ප. අංකය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *වර්ගය* |
|---|---|---|---|---|---|
| 01. | 14806/18 | - | - | 0110 | අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය (ලියා පදිංචි කළ නොහැක.) |
| 02. | 16488/18 | - | - | - | අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය (ලියා පදිංචි කළ නොහැක.) |
| 03. | 16714/18 | - | 15569 | 15596 | අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය (ලියා පදිංචි කළ නොහැක.) |
| 04. | 19162/19 | - | - | - | අත්ට්‍රැක්ටර් එන්ජිම (ලියා පදිංචි කළ නොහැක.) |
| 05. | 02396/2014 | 27-8003 | TXD 50-1685018 | - | ඉසුසු ලොරි රථය (ලියා පදිංචි කළ නොහැක.) |

07-699

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම - 2021 වර්ෂය**

2021 ජනවාරි මස 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලටද දැනට පවත්නා සියලු සුරාබදු කොන්දේසිවලට ද යටත්ව 2020 සැප්තැම්බර් මස 09 වැනි දින පෙ. ව. 10.30 දක්වා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

02. රේන්ද මිලදී ගැනීමට ඉදිරිපත් වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නියමකොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප්ගෙන් ලත් මුදල් කුවිතාන්සියක් ද ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවලට දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව කවරයක බහා එයට උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2020 සැප්තැම්බර් මස 09 වැනි දින පෙ.ව. 10.30ට සියලුම ටෙන්ඩර්කරුවන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. කිසියම් කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාදය මිලදීගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින ප.ව. 2.00ට පෙර උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. 2020 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2021 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අළුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රදාන කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබා ගත යුතුය.

08. 2020 සැප්තැම්බර් මස 09 වැනි දින රේන්ද විකිණීමෙහි ලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2020 ඔක්තෝබර් මස 27 වැනි දින පෙ.ව. 10.30ට නැවත රේන්ද විකිණීම මෙම ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය නම් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

සුමුදු පී. විතානගේ,
ප්‍රාදේශීය ලේකම්,
උඩුබද්දාව.

2020 ජුනි මස 24 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම - 2021 වර්ෂය

| අංකය හා නම | පත්තුව | තැබෑරුම විවෘත කළයුතු ප්‍රදේශය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් වසන දිනය හා වේලාව | තැබෑරුම් විවෘත කළ යුතු වේලාව | තැබෑරුම වැසිය යුතු වේලාව |
|---|---|---|---|---|---|---|
| උඩුබද්දාව අංක 2 | කටුගම්පල හත්පත්තුව | උඩුබද්දාව ගම තුළ | 1,000 | 2020.09.09 පෙ. ව. 10.30 | පෙ.ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 |

07-384

---

**ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - හම්බන්තොට**

2021 වර්ෂයට හම්බන්තොට කොට්ඨාසයේ රා රේන්ද විකිණීම

2021 ජනවාරි මස 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත උපලේඛනයේ විස්තර සඳහන් රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා පොදුවේ සෑම සුරා බදු බලපත්‍රයක්ම වෙනුවෙන් දැනට බලපවත්නා හා ඉදිරියට බලපැවැත්විය හැකි කොන්දේසිවලට යටත්ව හම්බන්තොට කොට්ඨාසයේ පිහිටි අංක 01 දරන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

02. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 5,000 ක් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් නියමිත පෝරමය ඉදිරිපත් කළ යුතුය. තව ද ටෙන්ඩර්කරු විසින් පහත සඳහන් *ගැසට් නිවේදනයේ* පරිදි වත්කම් සහිත සහතික ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගෙන ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුය.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතුය. නියෝජිතයෙකු විසින් හෝ ලාංකික නොවූ හා 1982.08.20 වැනි දින අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1982 වර්ෂයේ රා රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වන්නන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

04. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පස් දෙනෙකුට වඩා හවුල් වන ටෙන්ඩර් පත්‍ර ද ඉදිරිපත් කළ නොහැක.

05. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සීල් තබා කවරයේ වම්පස මුදුනේ "හම්බන්තොට කොට්ඨාසයේ අංක 01 දරන රා තැබෑරුම් රේන්ද සඳහා ටෙන්ඩර් - 2021" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. ටෙන්ඩර් සහිත කවරය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් 2020.08.10 වැනි දින පෙ.ව. 10.00 ඉකුත් වීමට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් වසන වේලාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන් වූ විට රේන්දය විකිණීමේ කොන්දේසි වලට අත්සන් කර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතුය.

07. ටෙන්ඩර් පත්‍රයේ හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ නියමිත හේතුන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. කිසියම් හේතුවක් නිසා ටෙන්ඩර් භාර ගැනීමට නියමිත 2020.08.10 වැනි දිනට අවලංගු කිරීමට සිදුවුවහොත් නැවත ටෙන්ඩර් භාර ගන්නා දිනය 2020.09.21 වැනි දින වේ.

09. වැඩි විස්තර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දන ගත හැකිය.

කෞශල්‍යා ගලප්පත්ති,
ප්‍රාදේශීය ලේකම්,
හම්බන්තොට.

2020 ජුනි මස 29 වැනි දින.
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**2021 වර්ෂයට හම්බන්තොට කොට්ඨාසයේ අනුමත කරන ලද රා තැබෑරුම**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර්පත් භාරගැනීම* | *තැබෑරුම විවෘතව තැබිය යුතු වේලාවන්* |
|---|---|---|---|---|
| 01 | හම්බන්තොට | හම්බන්තොට | 2020.08.10 පෙ.ව. 10.00 | පෙ.ව. 11.00 සිට<br>ප.ව. 2.00 දක්වා<br>සහ ප.ව. 5.00 සිට<br>ප.ව. 8.00 දක්වා |

07 - 441

---

**ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - බදුල්ල**

2021 වර්ෂය සඳහා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්දය විකිණීම

2021 ජනවාරි මස 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව, 2020.08.14 වැනි දින පෙරවරු 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබා ගැනීමට ඉදිරිපත්වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ආපසු ගෙවන රු. 5,000.00 ක් ගෙවා ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසිආකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියමකර ඇති මුදල් ගෙවා ලබාගත් ටෙන්ඩර් වටිනාකමින් 25% ඉක්මවන වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව

ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් භාර ගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2020.08.14 වැනි දින පෙරවරු 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2020.10.05 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින පස්වරු 2.00 ට පෙර බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැන ගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි වේ.

/

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2020 ජූනි මස 30 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

2021 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම පිළිබඳ විස්තර - බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
2021.01.01 වැනි දින සිට 2021.12.31 වැනි දින දක්වා

| *තැබෑරුමේ නම සහ ලිපිනය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රා. ලේ. කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| බදුල්ල අංක 01 රා තැබෑරුම | බදුල්ල | බදුල්ල මහ නගර සභා අංක 06 දරන කොට්ඨාසයේ හුණුකොටුව නමැති රජයේ ඉඩම | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 5,000 | 2020.08.14 පෙ.ව.10.30 **නැවත විකුණන දිනය .-** සාර්ථක ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවුවහොත් 2020.10.05 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකිණීම සිදු කෙරේ. |

07-538

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ 2020/2021 වර්ෂයේ රා, මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2020/2021 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වන මවිසින් 2020.08.24 වැනි දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය ;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය ;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපාහැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය ;

(iv) අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබාගන්නා ලද -

*(අ)* ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; සහ
*(ආ)* වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබන ලියුම් කවරයෙහි වම් කෙළවරේ මුදුනේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන් කර මහනුවර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතු යි. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම මහනුවර ප්‍රාදේශීය ලේකම්තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාර ගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් **"ගෙවීම සඳහා"** යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් **"ආරක්ෂිත චෙක්පත්"** නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි ය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ ඒ එක් එක් අයවළුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිලිව දැක්විය යුතු ය.

08. රා තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රයක් ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග (පීප්ප) රා නිකුත් නොකරනු ලබන බව සැලකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී හා වෙනත් හේතුන් මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන රා තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2020.09.30 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය.

2020 ජූලි මස 06 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**2020/2021 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව**

| | *අනුක්‍රමික අංක කොට්ඨාසය තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|
| 1. | අංක : 1 වටපුළුව | මහනුවර කොට්ඨාසයේ අංක 20 මහයියාව සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාසය | කටුගස්තොට පාරේ, එම පාර සහ ත්‍රිකුණාමල වීදිය මංසන්දියෙහි, කටුගස්තොට පාර සහ වට්ටාරන්තැන්න මංසන්ධිය අතර පාර මහනුවර නාගරිකයේ අංක 20 මහයියාව සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාසය තුළ පිහිටි ප්‍රදේශය | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2020.08.24 පෙ. ව. 10.30 |

*රා තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල - 2020/2021 :*

අංක 1 වටපුළුව - රා තැබෑරුම් රේන්දය රුපියල් 5,000.

07-664/1

## වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2021.01.01 සිට 2021.12.31 වර්ෂයේ තැබෑරුම් රා රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට සහ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු තැබෑරුම් රා රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත් ව 2021.01.01 සිට 2021.12.31 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන තැබෑරුම් රා රේන්ද සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් 2020.08.19 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

*(ආ)* ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදල් තැන්පත් කර ලබාගන්නා නිල කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු ය.

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත තැබෑරුම් රා රේන්ද විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු ය.

*(ඈ)* ටෙන්ඩර්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිළිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව ජාතික හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් ම/කපා හැරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක් ම ටෙන්ඩර් පෝර්ම සමග තමන්ගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය සහ නම් සඳහන් කර, වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර්පත් තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර, වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. මෙම මුදල වලපනේ ප්‍රාදේශීය ලේකම් නමින් නිල්දණ්ඩාහින්න මහජන බැංකුවේ වාර්ෂික ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් 'ගෙවීම සඳහා යන්න' සටහන් කරන ලද චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත්කොට, කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිපදෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත්, 2020.09.28 වැනි දින පෙරවරු 10.30ට මෙම ස්ථානයේ දී නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීමට අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ හැකි ය.

පී. එච්. සාලිය බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2020 ජූලි මස 09 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*රා තැබෑරුම් රේන්ද විකිණීම*

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටු වියයුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගන්නා දිනය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|
| අංක 05 පදියපැලැල්ල | පදියපැලැල්ල ග්‍රාමය තුළ | 2020.08.19 | පෙ.ව. 10.30 | 5,000.00 |

07-697

**මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම - 2020/2021 වර්ෂය

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව, එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම නැවත විකිණීම සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

(2) සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ම ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් කළ යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිළ ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% ට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

(3) විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනත වම් කෙළවරෙහි "අංක............................................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන්, පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2020.07.24 දින පෙ.ව. 10.30 ට පෙර මහවැව ප්‍රාදේශීය ලේකම් ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

(4) ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

(5) 2020.07.24 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

(6) මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.
(දුරකථන අංක : 032 -2254231, 0322252061).

එච්. එම්. නදීජා හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
මහවැව.

2020 ජූලි මස 14 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහවැව.

**උපලේඛනය**

| *රා තැබෑරුම් අංකය* | *ග්‍රාමය* | *තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|
| 18 | තොඩුවාව (උතුර) | 1,000.00 |

07-759

## මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - පුත්තලම දිස්ත්‍රික්කය

### මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම - (2020/2021 වර්ෂය) 2020 ජූලි මස 01 සිට 2021 ජුනි මස 30 දක්වා

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයකට ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ ''අංක.................................... දරන.......................................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2020.07.22 වැනි දින පෙ.ව. 10.30 ට පෙර මුන්දලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති, ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2020.07.22 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
(දුරකථන අංක : 032-2052271).

ජේ. ඒ. විජානි වසන්තිකා ,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2020 ජූලි මස 14 වැනි දින,
මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනුක්‍රමික අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත |
|---|---|---|---|---|---|---|
| 01. | මුන්දලම | මදුරන්කුලිය | පෙ.ව.11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2020.07.22<br>පෙ.ව.10.30 | 1,000 0 |
| 02. | මුන්දලම | මුක්කුතොඩුවාව | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2020.07.22<br>පෙ.ව.10.30 | 1,000 0 |

07-786

මගේ අංකය : ARA/ADM/ADMIN/6/7/5.

**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදේශ මත්පැන් තැබෑරුම් හා රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම - 2020/2021 වර්ෂය

**2020 ජූලි සිට 2021 ජුනි දක්වා**

2020 ජූලි මස 01 දින සිට 2021 ජුනි මස 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වන දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කල බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල පරිමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි අංක............. රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුම් නම සහ අංකය සඳහන් කොට 2020.07.22 වන දින ප.ව. 2.30 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

5. 2020.07.22 වැනි දින ප.ව. 2.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කල වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය. (032-4934343)

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ආරච්චිකට්ටුව.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් කල යුතු මුදල රු.* |
|---|---|---|---|---|
| ආරච්චිකට්ටුව | ආරච්චිකට්ටුව | 11 | 2020.07.22 ප.ව. 2.30 | 1,000 |
| ආරච්චිකට්ටුව | බත්තුළුඔය | 12 | 2020.07.22 ප.ව. 2.30 | 1,000 |

07-750

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ය කිරීම

එක්සත් රාජධානියේ ලන්ඩන් E6 IJG, හයි ස්ට්‍රීට් නෝර්ත් ඊස්ට් හැම්, අංක 213 හි සහ දැනට යාපනයේ දකුණ වන්නර්පන්නායි කේ. කේ. එස්. පාර, අංක 70/6 හි පදිංචි කොහිලවානි තිලාගරාජ් වන මා විසින් එක්සත් රාජධානියේ ලන්ඩන් E6 IJG, හයි ස්ට්‍රීට් නෝර්ත් ඊස්ට් හැම්, අංක 213 හි සහ දැනට යාපනයේ දකුණ වන්නර්පන්නායි, කේ. කේ. එස් පාර, අංක 70/6 හි පදිංචි තවරාජා තිලාගරාජ් වෙත ප්‍රදානය කරන ලද එස්. සතානන්තන් සොලිසිටර්වරයා විසින් සහතික කරන ලද 2010 සැප්තැම්බර් මස 29 වැනි දිනැති ඇටෝර්නි බලපත්‍රය මෙහි සඳහන් දින සිට අවලංගු වී අහෝසි වන අතර එය බලපැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

කොහිලවානි තිලාගරාජ්.

2020 ජූලි මස 17 වැනි දින දී ය.

07-439

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පුත්තලම, කුරුණෑගල පාර, අංක 223 හි පදිංචි (අංක 678551708 V දරන ජාතික හැඳුනුම්පත සතුව සිටින) වර්ණකුලසූරිය ප්‍රනාන්දුලාගේ නිමාලි වන මා විසින් පුත්තලම, කුරුණෑගල පාර, අංක 223 හි පදිංචි (අංක 710511608 V දරන ජාතික හැඳුනුම්පත සතුව සිටින) එල්පිටි ආචාරිගේ චමින්ද සුසන්ද ප්‍රෙමසිරි නැමැත්තාට ලබා දී ඇති හා වයඹ/උතුරුමැද කුරුණෑගල කලාප රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ අංක 2253 දරන දෛනික පොතේ ලියාපදිංචි කරන ලද පුත්තලමේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එම්. එස්. අබ්දුල් කාදර් මහතා විසින් සහතික කරන ලද අංක 33803 හා 2011.07.05 දින දරන සාමාන්‍ය ඇටෝර්නි බලපත්‍රය 2020.02.26 දින සිට අවලංගු කරන ලද බව ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දී සිටිමි.

වර්ණකුලසූරිය ප්‍රනාන්දුලාගේ නිමාලි.

07-375

---

## අයුර නැචුරල්ස් (පීවීටී) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීමේ මහජන නිවේදනය

''අයුර නැචුරල්ස් (පීවීටී) ලිමිටඩ්'' නමින් නව සමාගමක් සංස්ථාගත කර ඇති බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු. සමාගම් ලියාපදිංචි අංක PV 00222107 යටතේ 2020 මැයි මස 22 වැනි දින සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 91/3, පළමු පටුමග, සීවලිකෙලානිතිලක මාවත, කොහාල්විල, කෙලනිය.

මලින්ත හල්කවෙල,
ලේකම්.

අංක 02, වික්‍රමසිංහ මාවත,
කොටුව, ගාල්ල.

07-392

---

## දැන්වීමයි

කොච්චිකඩේ, මායිම් පාර, අංක 35, දරන ස්ථානයේ පදිංචි (ජා. හැ. අ. 750473270 V හිමි) ඒකනායක මුදියන්සේලාගේ දිනේෂ් චන්දික ඒකනායක සහ එම ලිපිනයේ ම පදිංචි (ජා. හැ. අ. 807770691 V හිමි) ගමගේ රසිකා සුභානි යන අය විසින් ඩබ්ලිව්. ජූඩ් නිව්මන් ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2009.09.29 වැනි දින ලියා සහතික කරන ලදුව කොච්චිකඩේ, මායිම් පාර, අංක 35 දරන ස්ථානයේ පදිංචි (ජා. හැ. අ. 472382845 V හිමි) ඒකනායක මුදියන්සේලාගේ පියසේන වෙත ප්‍රදානය කරන ලද බත්තරමුල්ල, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ, ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 21 කාණ්ඩයේ 136 වන පත්ඉරුවේ අංක 6966 දිනපොත් අංක යටතේ 2009.10.05 වැනි දින ලියාපදිංචි කර ඇති අංක 2458 දරන ඇටෝර්නි බලපත්‍රය ඒකනායක මුදියන්සේලාගේ දිනේෂ් චන්දික ඒකනායක සහ ගමගේ රසිකා සුභානි වන අප විසින් මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි පොදු මහජනතාව වෙත කරනු ලබන දැනුම්දීමය. තවද, මෙදින මෙම දැන්වීම පලකිරීමෙන් අනතුරුව ඇටෝර්නි බලකරු විසින් මෙම ඇටෝර්නි බලපත්‍රය භාවිතා කරමින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට ඇටෝර්නි අධිපතින් වන අප වග නොකියන බවටත්, සියලු දෙනා වෙත දන්වා සිටිමු.

ඒකනායක මුදියන්සේලාගේ දිනේෂ් චන්දික ඒකනායක,
ගමගේ රසිකා සුභානි.

07-410

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

වේයන්ගොඩ, කොට්ටල අංක 175/13 හි පදිංචිව සිට දැනට 2919, Arthur St Hollywood FL 33020 USA හි පදිංචි ශිරානි කාන්ති කිකුරිස් වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයටත් එහි ජනතාවටත් මින් දැනුම් දෙන වගනම්,

මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් සුනිල් ශාන්ත උක්වත්ත යන අය පත් කරමින් දෙන ලද, වර්ෂ 2019

දෙසැම්බර් මස 17 වන දින දරන බෘස් හෙන්රි හෝන්ස්ටෙයින් ෆ්ලොරිඩා හි ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවත් මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත් ය.

තවද, ඉහත කී සුනිල් ශාන්ත උක්වත්ත විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමට යටත් නොවන බව ද දැනුම් දෙනු ලැබේ.

ශිරානි කාන්ති කිකුටිස්.

07-411

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

අංක 4, වලව් වත්ත, මුදුකටුව හි පදිංචි පොන්නම්පෙරුමගේ ලක්මාලි ප්‍රියදර්ශනී ප්‍රනාන්දු වන මා දන්වා සිටින්නේ වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. දුලිප් ජේ. එන්. ප්‍රනාන්දු යන අය වර්ෂ 2014.04.14 වැනි දින ලියා සහතික කරනු ලබන අංක 776 දරන ඇටෝර්නි බලයෙන් මා විසින් පොන්නම්පෙරුමගේ රේණුකා මල්කාන්ති ප්‍රනාන්දු යන අය ඇටෝර්නි බලකරු ලෙස කරන ලද පත් කිරීම මින් අවලංගු කරන අතර එකී ඇටෝර්නි බලයේ සඳහන් කාරණා පිළිබඳව ඇය විසින් මා වෙනුවෙන් කරන ලද කවර හෝ ක්‍රියාවන් හෝ ඔප්පු තිරප්පු ආදිය පිළිබඳව මා වග නොකියන බවත් මෙයින් දන්වමි.

පී. එල්. පී. ප්‍රනාන්දු.

07-412

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ගණේමුල්ල, සුමේධ මාවත අංක 333/06 ලිපිනයේ පදිංචි රාජමුණි චමින්ද ජනක කුමාර රණවක වන මා හට, ගණේමුල්ල, කළුවල පාර, අංක 138/4 හි පදිංචි ආර්. එස්. කේ. දන්දුන්න සහ එම ලිපිනයේම පදිංචි ආර්. ඩී. යූ. කේ. රණවක යන දෙපළ විසින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් මහේෂ් හේරත් ලියා සහතික කළ අංක 5286, 2014.12.31 දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මා එහි ඇටෝර්නි බලකරු ලෙස පත්කළ අතර එකී ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කළ බව ප්‍රකාශ කර සිටිනු ලැබේ. (ගම්පහ ඇටෝර්නි බලපත්‍ර පොතේ 47 කාණ්ඩයේ 14 පත්ඉරුවේ 23451 දිනපොත හා 2015.02.10 දින)

ආර්. ඩී. ජේ. කේ. රණවක.

07-444

---

## ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆයිනෑන්ස් ලිමිටඩ්

ලියාපදිංචි අංකය PB 222

යෝජිත ප්‍රකාශ කළ ප්‍රාග්ධනය අවකරණය කිරීම

ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆයිනෑන්ස් ලිමිටඩ් සමාගමේ (''සමාගම'' මින් ඉදිරියට) අධ්‍යක්ෂ මණ්ඩලය එම සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය වන රුපියල් තුන්දහස් අනූ එක් මිලියන හයසිය හතර දහස් තුන්සිය හතලිස් එක (රුපියල් 3,091,604,341) නියෝජනය වන සාමාන්‍ය කොටස් හාර දහස් හයසිය විසි හතර මිලියන නවසිය අසූ හය දහස් අට (4,624,986,008) ප්‍රමාණය ප්‍රකාශ කළ ප්‍රාග්ධනය රුපියල් එක් දහස් තුන්සිය මිලියනයක් (රුපියල් 1,300,000,000) ලෙස හා ඉහත සඳහන් කළ සාමාන්‍ය කොටස් ප්‍රමාණය නොවෙනස් වන ලෙස අවකරණය වන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 59 වන වගන්තියට ප්‍රකාරව තීරණය කර ඇත.

ඉහත සඳහන් අවකරණය බලාත්මක කරනු ලබන්නේ එම සමාගමේ ඉදිරියට ගෙන යන ලද අලාභය වන රුපියල් එක් දහස් හත්සිය අනූ හය මිලියන හයසිය හතර දහස් තුන්සිය හතලිස් එක (රුපියල් 1,796,604,341) හිලව් කර නමුත් සමාගමේ නිකුත් කර ඇති, සම්පූර්ණ ගෙවා නිමි සාමාන්‍ය කොටස් ප්‍රමාණය නොවෙනස් වන ලෙසය.

ඉහත යෝජිත ප්‍රකාශ කළ ප්‍රාග්ධනය අවකරණය කිරීමට කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීමට විශේෂ යෝජනා සම්මුතියක් ලෙස යෝජනා සම්මතයක් සම්මත කර ගැනීමට අති විශේෂ මහා සභා රැස්වීමක් 2020 සැප්තැම්බර් මස 18 වන ද පැවැත්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆයිනෑන්ස් ලිමිටඩ්,
76, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල.

07-471

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බත්තරමුල්ල, පැලවත්ත, ආසිරි උයන (3 පටුමග), අංක 769/20ඒ හි පදිංචි නාකන්දලගේ දොන් යසන්ත චන්දිමල් වීරසිංහ (ජාතික හැඳුනුම්පත් අංකය 712582200 V) වන මම බත්තරමුල්ල, පැලවත්ත, ආසිරි උයන (3 පටුමග), අංක 769/20ඒ හි පදිංචි වතවන විතානවසම් වායා තිලිනි (ජාතික හැඳුනුම්පත් අංකය 758121690 V) යන අයට ගම්පහ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් මනෝරි ඩී. ගලබඩ මහත්මිය විසින් සහතික කළ අංක 345 දරන 2015.09.03 දින සහිත මා වෙනුවෙන් ක්‍රියා කිරීමට දී තිබූ ඇටෝර්නි බලපත්‍රය 2020.07.20 දින පටන් බලපැවැත්වෙන පරිදි අවලංගු කොට බලරහිත කරමි.

තවද, මෙම දිනයෙන් පසුව එම වතවන විතානවසම් වායා තිලිනි මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ද දැනුම් දෙනු ලැබේ.

නාකන්දලගේ දොන් යසන්ත චන්දිමල් වීරසිංහ.

07-473

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සෙන්ට්‍රල් පර්ල් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 00222158
සංස්ථාගත කළ දිනය : 2020.05.24
ලියාපදිංචි ලිපිනය : අංක 16/15, විසල් උයන, හිරන, පානදුර, ශ්‍රී ලංකාව.

සමාගම් ලේකම්.

07-570

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කෝට්ටේ, ඇතුල්කෝට්ටේ, කොටුබැම්ම පාර, 3 වන පටුමග, අංක 70/10 හි පදිංචි වාරික්කාල තෙරේසා ලෝනප්පන් (ජා. හැ. ප. අංක 517203530 X) වන මම ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජේ. කුමාරසිරි ද සිල්වා විසින් වර්ෂ 2005.07.28 වැනි දින ලියා සහතික කරන ලද අංක 1000 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් කෝට්ටේ, ඇතුල්කෝට්ටේ, කොටුබැම්ම පාර, 3 වන පටුමග, අංක 64/1 හි පදිංචි වාරික්කාල ඇන්තනී, ලෝනප්පන් යන අය වෙත පවරන ලද ඇටර්නි බලපත්‍රය, මෙතැන් සිට බලපැවැත්වීමක් නොමැති බව ද, එකී ඇටර්නි බලපත්‍රය මත මා වෙනුවෙන් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකින් මින් ඉදිරියට මා බැඳී නොසිටින බව ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, ශ්‍රී ලංකාවාසී සියළු දෙනාටත් මෙයින් දැනුම් දෙමි.

වාරික්කාල තෙරේසා ලෝනප්පන්,
(ජා. හැ. ප. අංක 517203530 X)

07-605

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල තැපැල් වසමේ වත්තල හැඳල කුඩගහපිටිය අංක 24 දරන ස්ථානයේ පදිංචි ජයසේකර ආරච්චිගේ සුනේත්‍රා (ජා. හැ. ප. අංක 648631952 V) වන මා විසින් වත්තල, කෙරවලපිටිය, අංක 220 හි පදිංචි මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ටී. ලියනගේ මහතා විසින් වර්ෂ 1999.01.11 වැනි දින සහතික කරන ලද අංක 227 දරන කොළඹ පිහිටි රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර පොතේ 197 කාණ්ඩයේ 11 පත් ඉරුවේ 2452 දරන දිනපොත් අංකය සහ 1999.03.29 දින යටතේ ලියාපදිංචි වී ඇති ඇටර්නි බලපත්‍රයෙන් එකී වත්තල තැපැල් වසමේ වත්තල, හැඳල, කුඩගහපිටිය, අංක 24 දරන ස්ථානයේ පදිංචි ජයසේකර ආරච්චිගේ සමන්ත (ජා. හැ. ප. අංක 721561232 V) යන අය මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු ලෙස පත්කර ඇති අතර එම ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දනුම් දෙමි. ඒ අනුව එකී ඇටර්නි බලපත්‍රය උපයෝගී කර ගනිමින් කරනු ලබන සියලු කටයුතු අවලංගු හා බලරහිත බව ද මෙයින් දනුම් දෙමි.

ජයසේකර ආරච්චිගේ සුනේත්‍රා.

07-606

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

සියඹලාපේ, සියඹලාපේ දකුණ, අංක 209 දරන ස්ථානයේ පදිංචි උස්හෙට්ටිගේ ලසන්ත පෙරේරා සිරිවර්ධන වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. රේණුකා ප්‍රියදර්ශනී මහත්මිය විසින් සහතික කරන ලද අංක 7602 සහ 2020 මැයි මස 12 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් මඩපාත, බටුවන්දර, මඩපාත පාර, අංක 138 ජේ දරන ස්ථානයේ පදිංචි මීගමු ආරච්චිගේ ප්‍රියන්ති දීපිකා යන අයට පවරන ලද විශේෂ ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබේ.

එකී ඇටෝර්නි බලකාරිය මීගමු ආරච්චිගේ ප්‍රියන්ති දීපිකා විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබේ.

උස්හෙට්ටිගේ ලසන්ත පෙරේරා සිරිවර්ධන.

2020 ජුනි මස 29 වැනි දින දී ය.

07-665

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

පහත අත්සන් කරන දූනට සීදුව, ලියනගේමුල්ල, බබාගුරුවත්ත, අංක 556 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 710682917 V හිමි යද්දල ගමරාලලාගේ පාලිත විජයලක්සිරි වන මා විසින් කිරිදිවැල, මිලවලාන, අංක 159/2 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 685263203 V හිමි යද්දල ගමරාලලාගේ සුසන්තා නාලනී යන අය වෙත ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ශාරිකා ජයරත්න මහත්මිය විසින් 2014.09.25 දින සහතික කරන ලද අංක 4766 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත් එකී යද්දල ගමරාලලාගේ සුසන්තා නාලනී යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් තවදුරටත් ක්‍රියා නොකරන බවත් මෙතැන් පටන් ඇය විසින් එළඹෙන කවර හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ආණ්ඩුවටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

යද්දල ගමරාලලාගේ පාලිත විජයලක්සිරි.

2020 ජුනි මස 27 වැනි දින.

07-666

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වනු ලැබේ.

සමාගමේ නම : කේ එන් සෙකියුරිටි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 122806
ලියාපදිංචි කළ දිනය : 2017.06.02
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 186, මොරටුව පාර, සුවාරපොල, පිළියන්දල.

අධ්‍යක්ෂ.

07-667

# රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත්

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය

### විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2020/2021 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2020/2021 වර්ෂය තුළ විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වන මවිසින් 2020.08.25 වැනි දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර-

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත්කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.
(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය.
(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.
(iv) අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද,

*(අ)* ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; සහ
*(ආ)* වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබන ලියුම් කවරයෙහි වම් කෙළවරේ මුදුනේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන් කර මහනුවර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුයි. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම මහනුවර ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාරගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය. මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් "ගෙවීම සඳහා" යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත්" නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකිය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිලිව දැක්විය යුතු ය.

08. විදේශ මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රයක් ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග විදේශ මත්පැන් නිකුත් නොකරනු ලබන බව සැලකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී හා වෙනත් හේතු මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකිවූ විදේශ මත්පැන් තැබෑරුම්, නැවත විකිණීම 2020.09.25 වැනි දින පෙ.ව. 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැක.

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළය.

2020 ජූලි මස 06 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

***2020/2021 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව***

| *අනුක්‍රමික අංක කොට්ඨාසය තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| 1. අංක : කොළඹ වීදිය | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල වීදිය | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල ඡන්ද කොට්ඨාසය තුළ කොළඹ වීදිය සහ කාසල්හිල් වීදිය මංසන්ධියෙන් කොළඹ වීදිය වඩුගොඩපිටිය පාරේ මංසන්ධියටත් අතර කොළඹ වීදිය දෙපාර්ශවයේ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2020.08.25 පෙ.ව. 10.30 |

*විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල* - 2020/2021

1. අංක 1 විදේශ මත්පැන් තැබෑරුම් - රුපියල් 5,000.

07-664/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ඩී. එෆ්. සී. සී. බැංකුව පී. එල්. සී.**

(ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුව පී. එල්. සී. හි අනුප්‍රාප්තික)

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 09 වන වගන්තිය ප්‍රකාරව වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1192 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මැද පත්තුව සියනෑ කෝරළේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 243 A පහළ ඉඹුල්ගොඩ ග්‍රාම නිලධාරි වසමට අයත් පහළ ඉඹුල්ගොඩ පිහිටි රෙනෙගහලන්ද ලෙස හැඳින්වෙන ඉඩම, බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. පෙරේරා විසින් සාදන ලද 2016.02.11 දිනැති අංක 6023 දරන පිඹුරු පතෙහි ලොට් අංක 7A ලෙස දැක්වෙන සීමා නිර්ණය කොට බෙද වෙන් කරන ලද හා ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ පර්චස් විසිදෙකක (අ. 0, රූ. 0, පර්. 22.0) ප්‍රමාණය සහිත වූ ඉඩම උතුරින් එම ඉඩමේ ම ඩී. ඒ. ප්‍රියන්ත විසින් හිමිකම ලබාගත් ඉඩමේ කොටසක් මගින් ද, නැගෙනහිරින් එම ඉඩමේ ම නානයක්කාර විසින් හිමිකම ලබාගත් ඉඩමේ කොටසක් මගින් ද, දකුණින් එම ඉඩමේ ම නානයක්කාර විසින් හිමිකම ලබාගත් ඉඩමේ කොටසක් මගින් හා පිඹුරුපත් අංක 3485 හි ලොට් අංක 9 මගින් ද, බටහිරින් පී. ආර්. ඩී. ඒ. මාවත (රනේගල පාර) මගින් ද මායිම් වී ඇති ඉඩම හා එහි අඩංගු වගා, ගොඩනැගිලි ඇතුළු සියල්ලත් සමගම.

**ඉහත 7 A ලෙස සඳහන් සීමා නිර්ණය කළ ඉඩම නැවත මිනුම් කළ පසු**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මැද පත්තුව සියනෑ කෝරළේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 243 A පහළ ඉඹුල්ගොඩ ග්‍රාම නිලධාරි වසමට අයත් පහළ ඉඹුල්ගොඩ පිහිටි රෙනෙගහලන්ද ලෙස හැඳින්වෙන ඉඩම, බලයලත් මිනින්දෝරු වී. ජේ. ජේ. පෙරේරා විසින් සාදන ලද 1983.06.18 දිනැති අංක 8541 දරන පිඹුරු පතෙහි ලොට් අංක 7A ලෙස දැක්වෙන සීමා නිර්ණය කොට බෙදා වෙන් කරන ලද හා ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ පර්චස් විසිදෙකක (අ. 0, රූ. 0, පර්. 22.0) ප්‍රමාණය සහිත වූ ඉඩම උතුරින් මාර්ගය මගින් ද, නැගෙනහිරින් එම ඉඩමේ ම කොටසක් මගින්, දකුණින් එම ඉඩමේ ම කොටසක් මගින් හා බටහිරින් එම ඉඩමේ ම ලොට් අංක 9 මගින් ද මායිම් වී ඇති ඉඩම හා එහි අඩංගු වගා, ගොඩනැගිලි ඇතුළු සියල්ලත් සමග ම

උක්ත දේපළ ඩී. එෆ්. සී. සී. බැංකුව පී. එල්. සී. වෙත උකස් කළේ :

ඩී. එෆ්. සී. සී. බැංකුවේ නමින් (ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුවේ අනුප්‍රාප්තික) මත ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් රුවන්ති ෆොන්සේකා හමුවේ 2017.05.08 දින දිවුරුම් දුන් පරිදි අංක 1192 උකස් බැඳුම්කරය සඳහා කරඳ කැටියේ ගෙදර හිරාන් රනිල ඉන්ද්‍රජිත් යන බන්ධනදයකයා පොරොන්දු වූ පරිදි ගෙවීම් පැහැර හැර ඇත.

ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් මාහට පවරන ලද බලය යටතේ ඉහත සඳහන් කළ දේපළ 2020 අගෝස්තු මස 14 වැනි සිකුරාදා දින පෙරවරු 10.30 ට අංක 341 නුවර පාර, කඩවත යන ස්ථානයේ පිහිටි ඩී. එෆ්. සී. සී. බැංකුවේ කඩවත ශාඛාවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණනු ලබන බව දැනුම් දෙමු.

*දේපළ සඳහා වූ ප්‍රවේශය.* - කොළඹ සිට මහනුවර මාර්ගයේ කිලෝමීටර 21 සැතපුම් කණුව සහ කොකිස්කඩේ හන්දිය පසු කර රෙනගල පාර දිගේ මීටර් 500ක් ගමන් කොට වමට හැරී විට අදාළ දේපළ සහිත ඉඩම මීටර 25ක් පමණ දක්ෂිණාවර්ත වංගුවේ වම්පසට වන්නට පිහිටා ඇත. යෝජනාව පිළිබඳ නිවේදනය සඳහා කැරුණාකර 2019.06.28 දිනැති රජයේ ගැසට් පත්‍රය සහ 2019.06.13 දිනැති දිනපතා දිවයින, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් මිටිය පහත හෙළීමත් සමගම පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) සහ කොමිස් මුදල මත අදාළ බදු,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
5. විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු (තිබේ නම්),
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද, වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු ය.

වැඩිදුර විස්තර සඳහා ඩී. එෆ්. සී. සී. බැංකුව පී. එල්. සී. හි නීති දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වන්න.

දුරකථන අංක 011- 2371371.

* පූර්ව දැනුම් දීමකින් තොරව මෙම වෙන්දේසිය අත්හිටුවීමට/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 146/3, කල්දේරා උද්‍යානය, පහළ දුටුගැමුණු වීදිය,
කොහුවල.
දුරකථන අංක : 011 4367467, 011- 4367111
aucslk@gmail.com

07-474

HNB 38 - 19

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - බටපොළ ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වාසියට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද අංක 58 හා 2014.12.30, අංක 137 හා 2016.08.18, අංක 270 හා 2017.12.28 වැනි දින දරන බැඳුම්කර මත අය විය යුතු මුදල් ගෙවීම අයි. කේ. හෝල්ඩින්ස්හි තනි අයිතිකරු කීඹියගේ ඉනුෂ්ක නාමල් කුමාරසිරි ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ 2020 ක් වූ අගෝස්තු මස 24 වැනි දින ප. ව. 12.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ පළාත් පාලන ප්‍රදේශ තුළ අංක 75 සී බටපොළ උතුර ග්‍රාම නිලධාරී වසම තුළ බටපොළහි පිහිටි පත්‍රකැටියකැලේ හෙවත් පත්තරකැටියකැලේ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩබ්ලිව්. එස්. කේ. වික්නරාජා විසින් සාදන ලද අංක 2013/625 හා 2013.06.13 දින දරන පිඹුරේ ලොට් A වශයෙන් දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වන ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දහසයයි දශම පහයි හතර (අ. 0, රූ. 3, පර්. 16.54) ක විශාලත්වයෙන් යුක්ත ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේත් වේ. මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම පත් ඉරුව සී. 86/55 යටතේ ලියාපදිංචි වී තිබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.08.09 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.08.16 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - බටපොළ අම්බලන්ගොඩ මාර්ගයේ කි. මී. 1/2 පමණ පොල්ලැව්ව පාර දක්වා ගමන් කර එම මාර්ගයේ කි. මී. 1/8 පමණ ගිය පසු පාරේ දකුණු අත පැත්තේ අදාල දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියය (රු. 1,500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661828, 2661866.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනට ම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව.
දුරකථන අංක : 091 - 2277105, 0779 - 663420
ඊ මේල් : ejayawardhana77@gmail.com

07-469

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

උපාලි එන්ටර්ප්‍රයිසස්.
ගිණුම් අංක : 0211 1000 0186.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019. 11.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැත්තෑ තුන් ලක්ෂ හත් දහස් දෙසිය තිස් දෙකයි ශත පනස් දෙකක (රු. 7,307,232.52) මුදලද, 2019 ඔක්තෝබර් මස 17 වැනි දින සිට අංක 5805 සහ 1995 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට නම ලක්ෂ හතළිස් තුන් දහස් තුන්සිය අනූ දෙකයි

ශත අසූ අටක (රු. 6,943,392.88) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතක් (17%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.02.28 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.02.19 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.08.18 වැනි දින පෙ.ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ කඩුවෙල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මුත්තෙට්ටුගොඩ, අංක 477 B ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, තලාහේන පිහිටි "TP 77941 හි කොටසක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. කේ. එස්. බමුණුසිංහ යන අය විසින් සාදන ලද 2009 සැප්තැම්බර් මස 14 දාතම හා අංක 1312 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් $B^{4A1}$ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : විජය මාවත සහ ලොට් $B^{4A1}$, නැගෙනහිරට : අංක 6566 දරන පිඹුරේ ලොට් $B^{3B}$ සහ ලොට් $B^{4B1}$, දකුණට : අංක 6566 දරන එකී පිඹුරේ ලොට් $B^{3B}$ සහ ලොට් $B^{3A}$ සහ බස්නාහිරට : අංක 6566 දරන එකී පිඹුරේ ලොට් $B^{3A}$ සහ විජය මාවත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටක් (A:0, R:0, P:8) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1312 දරන පිඹුරට අනුවය.

එකී ලොට් $B^{4A1}$ පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ කඩුවෙල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මුත්තෙට්ටුගොඩ, අංක 477 B ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, තලාහේන පිහිටි "TP 77941 හි කොටසක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. ලියනසූරිය යන අය විසින් සාදන ලද 1996 දෙසැම්බර් 30 දාතම හා අංක 6566 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් $B^{4A}$ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : විජය මාවත සහ ලොට් $B^{4B}$, නැගෙනහිරට : ලොට් $B^{4B}$ සහ ලොට් $B^{3B}$, දකුණට : ලොට් $B^{3B}$ සහ ලොට් $B^{3A}$ සහ බස්නාහිරට : ලොට් $B^{3A}$ සහ විජය මාවත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටක් (A:0 R:0 P:8) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6566 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 1351/39 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-490

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ ඒ එස් ඔටෝ ඉන්ට(ර්)නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0211 1000 1336.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.03.26 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන් කෝටි හැට දෙලක්ෂ අනූ දෙදහස් පන්සිය හතළිස් තුනයි ශත නමයක් (රු. 56,292,543.09) මුදලද, 2019 මාර්තු මස 13 දින සිට අංක 1365 සහ 1746 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටි පනස් හත් ලක්ෂ දහසය දහසක (රු. 45,716,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවයි දශම පහක් (15.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.07.03 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.06.18 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.08.14 වැනි දින පෙ.ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ කඩුවෙල

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ වැලිවිට, 475 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැලිවිට පිහිටි අවිස්සාවේල්ල පාර, වරිපනම් අංක 389/13 දරන "පාරේවත්ත සහ කීරගහඹිවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. තෙපුලන්ගොඩ යන අය විසින් සාදන ලද 2017 ජනවාරි මස 05 දාතම හා අංක 5190 දරන මිනුම් පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අවිස්සාවේල්ල පාර, නැගෙනහිරට : පාර හා බී. පැට්‍රිෂියා විසින් හිමිකම් කියන ඉඩම, දකුණට : අඩි 12 පළල පාර (අංක 3297 දරන පිඹුරේ ලොට් 9) සහ අංක 127 දරන පිඹුරේ ලොට් 7, බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හතයි දශම තුනයි එකක් (A:0, R:0, P:37.31) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 5190 දරන එකී පිඹුරට අනුවය.

එකී ලොට් 1A පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී කඩුවෙල ග්‍රාම කම්ටුව තුළ (වර්තමානයේ කඩුවෙල ප්‍රාදේශීය සභා) වැලිවිට පිහිටි "පාරේවත්ත සහ කීරගහඹිවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. ඩී. ජේ. පෙරේරා යන අය විසින් සාදන ලද 1975 අප්‍රේල් මස 05 දාතම හා අංක 164 දරන මිනුම් පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලෝ ලෙවල් පාර, නැගෙනහිරට : මෙහි ලොට් 2, දකුණට : ඒ. වින්සන්ට් පිරේරා සහ ඩී. ෆ්‍රැන්සිස් පෙරේරා ගේ දේපළ, බස්නාහිරට : ඩී. ෆ්‍රැන්සිස් පෙරේරාගේ දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හතයි දශම තුනයි එකක් (A:0, R:0, P:37.31) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 164 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 1160/63 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

07 - 491

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

රෝලංකා ට්‍රේඩ් සෙන්ටර්.

ගිණුම් අංක : 0005 1001 2445.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.10.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි හැත්තෑ හත් ලක්ෂ විසිපන් දහස් හයසිය තිස් අටයි ශත තිස් පහක (රු. 17,725,638.35) මුදල ද, 2019 ඔක්තෝබර් මස 10 වැනි දින සිට අංක 2091, 228, 2473, 1495, 1915 සහ 1981 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි නම ලක්ෂ හාර දහසක (රු. 10,904,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් පනස් ලක්ෂ හැත්තෑ නම දහස් නමසිය අනූ පහයි ශත හැට තුනක (රු. 5,079,995.63) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවයි දශම පහක් (15.5%) හා තවත් රුපියල් දස ලක්ෂයක (රු. 1,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොළිය ද, දූන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.12.06 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.12.04 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා පුවත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.08.21 වැනි දින පෙ.ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ කොහල්විල අංක 259B දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දළුගම කොහල්විල ග්‍රාමයේ පිහිටි පන්සල පාර වරිපනම් අංක 119/05 දරන "කුරුඳුවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2013 ජූලි මස 10 දාතම හා අංක 761/2013 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 2B/1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රොසලින් අමරසිංහ සහ වෙනත් අයගේ ඉඩම, නැගෙනහිරට : අංක 144/1999 දරන පිඹුරේ ලොට් 2C , දකුණට : අංක 144/1999 දරන පිඹුරේ ලොට් 2A සහ ලොට් 2 D/1 (පාර සඳහා වෙන්කිරීම) ඩී. ජයරත්න මහත්මියගේ ඉඩම සහ බස්නාහිරට: අංක 144/1999 දරන පිඹුරේ ලොට් 2A සහ ලොට් 2 D/1 (පාර සඳහා වෙන්කිරීම) සහ ඩබ්ලිව්. එම්. කේ. පෙරේරා සහ වෙනත් අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිහතරයි දශම බිංදුවයි පහක් (A.0, R.1, P. 24.05) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්

සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 761/2013 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 2B/1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී දළුගම කොහල්විල ග්‍රාමයේ පිහිටි "කුරුඳුවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඒ. රූපසිංහ යන අය විසින් සාදන ලද 1999 මාර්තු මස 05 දාතම හා අංක 144/1999 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 2B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රොසලින් අමරසිංහ සහ වෙනත් අයගේ ඉඩම, නැගෙනහිරට : ලොට් 2C, දකුණට: මෙම ඉඩමේ ලොට් 2A, 2B සහ ඩී. ජයරත්න මහත්මියගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 2A, 2D සහ කරුණා පෙරේරාගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් විසිපහයි දශම අටයි බිංදුවක් (A.0, R.1, P. 25.80) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 144/1999 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 38/144 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(බලයලත් මානක තැන කේ. ඒ. රූපසිංහ යන අය විසින් සාදන ලද 1999 මාර්තු මස 05 දාතම හා අංක 144/1999 දරන එකී පිඹුරේ ලොට් 2D හි නැවත මිනුමක් වන) බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2013 ජූලි මස 10 දාතම හා අංක 761/2013 දරන පිඹුරේ ලොට් 2 D/1 දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-492

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

රාජකරුණා මෝටර් ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - ගිණුම් අංක 0073 1000 1109.
එච්. එම්. ආර්. සී. ශ්‍රී රාජකරුණා සහ ජී. ඊ. එම්. එන්. ඒකනායක ගිණුම් අංක 1073 5489 0636.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.06.27 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස් දෙකෝටි හැත්තෑ ලක්ෂ අසූදෙදහස් අටසිය පහළවයි ශත තිස් හතක (රු. 327,082,815.37) මුදලද, 2019 ජුනි මස 13 වැනි දින සිට අංක 2814, 782, 2816, 2812 සහ 2205 දරන එකී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අනූ තුන් ලක්ෂ විසි අට දහසක (රු. 9,328,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Two Decimal Five per centum (2.5%) (Floor rate of 12%) බැගින් වූ පොලිය ද, රුපියල් දහහත් කෝටි පනස් ලක්ෂයක (රු. 175,000,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Three Decimal Five per centum (3.5%) බැගින් වූ පොලිය ද හා තවත් රුපියල් දොළොස් කෝටි තිස් එක් ලක්ෂ විසි පන් දහසක (රු. 123,125,000) මුදලක් සඳහා සියයට අටයි දශම හතයි පහක් (8.75%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.08.09 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.07.26 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.08.12 වැනි දින උපලේඛන අංක 1 යටතේ පෙ.ව. 10.30 ට, උපලේඛන අංක 2 හා 4 යටතේ ප. ව. 1ට සහ ප. ව. 1.15 සහ උපලේඛන අංක 3 යටතේ ප. ව. 12.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ශාන්තාලෝකගම අංක 447/A ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ ඔරුවල ග්‍රාමයේ පිහිටි, වරිපනම් අංක 23, 04 වෙනි පටුමගෙහි ''වනපොතුමූකලාන, ඔරුවල එස්ටේට්, දෙනගහදෙණිය සහ මහකැලේමූකලාන'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී.ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 2014 මැයි මස 08 දාතම හා අංක. 5949 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : සිමෙන්ති කාණුව (අංක. 2535 දරන පිඹුරේ ලොට් 391A) නැගෙනහිරට : 10m පළල පාර (අංක. 2535 දරන පිඹුරේ ලොට් 391B), දකුණට : එච්. එම්. ආර්. සී. එස්. රාජකරුණා යන අය විසින් හිමිකම් කියනු ලබන අංක 5848 දරන පිඹුරේ නිරූපිත ඉඩම සහ බස්නාහිරට : අංක 2535 දරන පිඹුරේ ලොට් 364 යන මායිම් තුළ පිහිටි

ප්‍රමාණයෙන් පර්චස් හතක් (A. 0, R. 0, P. 7) විශාල ඉඩම් කොටස එකී අංක. 5949 දරන පිඹුරට අනුවය.

එකී ලොට් B පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී ඔරුවල ග්‍රාමයේ පිහිටි, ''වනපොතුමූකලාන, ඔරුවල එස්ටේට්, දෙනගහදෙණිය සහ මහකැලේමූකලාන''යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී. ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 1999 ජුනි මස 22 දාතම හා අංක 2535 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 380 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 391A, නැගෙනහිරට : ලොට් 391B, දකුණට : ලොට් 379 සහ බස්නාහිරට :ලොට් 364 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතක් (A. 0, R. 0, P. 7) ක් විශාල ඉඩම් කොටස එකී අංක. 2535 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 732/03 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක. 2535 දරන පිඹුරේ නිරූපිත ලොට් 391B, 297, 232 සහ 233 දිගේ ඒවා මතින් යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

(උකස් බැඳුම්කර අංක 2816 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සීමාවන් තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වෝඩ් අංක 37, කොල්ලුපිටිය පාරේ පිහිටි ''ද මොනාක් ඇට් ක්‍රෙස්කැට් සිටි'' යයි කියනු ලබන සහ හඳුන්වනු ලබන ගොඩනැගිල්ලේ කොළඹ 03 (ගාලු පාර) කොල්ලුපිටිය පාර, වරිපනම් අංක. 89/15/2 දරන ඉඩමට බලයලත් මානක තැන ජී. බී. දොඩන්වල යන අය විසින් සාදන ලද 2008 පෙබරවාරි 26 දාතම හා අංක 6562 දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත නේවාසික සහාධිපත්‍ය එපාර්ට්මන්ට් පාර්සල් කැබලි අංක Y/F15/U7 ට මායිම්, උතුරට : පාර්සල් කැබලි අංක CE F15/10 සහ CE F5/16, නැනෙහිරට : පාර්සල් කැබලි අංක CE F 5/16 සහ Y/F5/U6 (face above), දකුණට : පාර්සල් කැබලි අංක Y/F5/U6 (face above), Y/F5/U7 (face above) සහ Y/F15/U8, බස්නාහිරට : පාර්සල් කැබලි අංක Y/F15/U8 සහ CE F 15/10 Zenith : (උඩ අහස් මුදුන) පාර්සල් කැබලි අංක Y/F16/U6 Nadir : (යට අහස් මුදුන) පාර්සල් කබැලි අංක Y/F14/U7 වර්ග මීටර එකසිය විසි හයක් අඩංගු බිම් ප්‍රදේශය (126 Sq.m.). එකී සහාධිපත්‍ය කැබැල්ල ඔප්පු අංක Con E 49/64 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

මෙම පාර්සල් කැබැල්ලට ආසන්නතම පොදු පිවිසුම් පෙදෙස CE F 15/10 වේ.

අංක Y/F15/U7 දරන මෙම සහාධිපත්‍ය පාර්සල් කැබැල්ල නිදන කාමර දෙකකින්, සාලයකින් සහ කෑම කාමරයකින්, පැන්ට්‍රියකින් (මුළුතැන් ගෙයකින්), නාන කාමර දෙකකින්, ගබඩා කාමරයකින්, සහ බැල්කනියකින් සමන්විතයි.

එකී අංක 6562 දරන සහාධිපත්‍ය පිඹුරේ උපාංග පාර්සල් කැබලි අංක A 116 (වාහන නැවතීම් අංගනය) මෙම පාර්සල් කැබැල්ල සඳහා වෙන් කරනු ලබන අතර එය පහත සඳහන් පරිදි වේ.

උතුරට : පාර්සල් කැබලි අංක A 115,
නැගෙනහිරට : CE F 2/26,
දකුණට : CE F 2/26,
බස්නාහිරට : CE F 2/26,
Zenith : (උඩ අහස් මුදුන) මෙම පාර්සල් කැබැල්ලේ මුහුණත.
Nadir : (යට අහස් මුදුන) මෙම පාර්සල් කැබැල්ලේ කොන්ක්‍රීට් පොළව.
වර්ග මීටර් දොළහක් අඩංගු බිම් ප්‍රදේශය (12 Sq.m.).

මෙම සහාධිපත්‍ය කැබැල්ලට අනුබද්ධ පොදු පහසුකම් භාවිතා කිරීමේ අයිතිය ද හා සමගය.

අංක Y/F15/U7 දරන මෙම සහාධිපත්‍ය කැබැල්ලේ සහ එහි සහාධිපත්‍ය දේපළේ පොදු පහසුකම් හි උපාංග පාර්සල් කැබලි අංක A 116 හි නොබෙදූ කොටස් අගය 32 කි.

බලයලත් මානක තැන හියු ආර්. සමරසිංහ විසින් සාදන ලද 1995 නොවැම්බර් 16 දාතම අංක 2289 දරන පිඹුරේ නිරූපිත ලොට් 07 (මාර්ග වෙන්කිරීම) දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ අයිතිය ද සමගය.

(උකස් බැඳුම්කර අංක 2814 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.)

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවන් තුළ සහ මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ නාවල නැගෙනහිර අංක 520B ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නාවල, පිහිටි, පරණ පාර, 1 වෙනි පටුමග, වරිපනම් අංක 21B දරන ''ලියනගහ කුරුඳුවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. වී. එම්. ඩබ්ලිව්. සමරනායක යන අය විසින් සාදන ලද 2010 සැප්තැම්බර් 21 දාතම හා අංක 3878A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් C වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 4703 දරන පිඹුරේ ලොට් 1A, නැගෙනහිරට : පෞද්ගලික පාර, දකුණට : 1 වෙනි පටුමග සහ බස්නාහිරට : ලොට් B යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි එකක් (A. 0, R. 0, P. 21) විශාල ඉඩම් කොටස එකී අංක 3878A දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 161/77 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එම්. එස්. ටී. පී. සේනාධීර විසින් සාදන ලද 1973 සැප්තැම්බර් මස 4 දාතම හා අංක 669 දරන පිඹුරේ නිරූපිත ලොට් A දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ අයිතිය ද සමගය.

(උකස් බැඳුම්කර අංක 2205 සහ 2812 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.)

4. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සීමාවන් තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වෝඩ් අංක 37, කොල්ලුපිටිය පාරේ පිහිටි ''ද මොනාක් ඇට් ක්‍රෙස්කැට් සිටි'' යයි කියනු ලබන සහ හඳුන්වනු ලබන ගොඩනැගිල්ලේ කොළඹ 03 (ගාලු පාර) කොල්ලුපිටිය පාර, වරිපනම් අංක 89/19/8 දරන පාර්සල් කැබැල්ලට බලයලත් මානක තැන ජී. බී. දොඩන්වල යන අය විසින් සාදන ලද 2008 පෙබරවාරි 26 දාතම හා අංක 6562 දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත දහ නම වෙනි මහලේ (19 වෙනි) නේවාසික සහාධිපත්‍ය එපාර්ට්මන්ට් පාර්සල් කැබලි අංක Y/F19/U4 ට මායිම් :

උතුරට : පාර්සල් කැබලි අංක Y/F5/U3 (face above) සහ Y/F5/U4 (face above) සහ Y/F19/U5, නැගෙනහිරට : පාර්සල් කැබලි අංක Y/F19/U5 සහ CE F19/10, දකුණට : පාර්සල් කැබලි අංක CE F19/10 සහ Parcel Y/F19/U3, බස්නාහිරට : පාර්සල් කැබලි අංක Y/F19/U3 සහ Y/F5/U3 (face above)

Zenith : (උඩ අහස් මුදුන) පාර්සල් කැබලි අංක Y/F20/U3

Nadir : (යට අහස් මුදුන) පාර්සල් කැබලි අංක Y/F18/U4

වර්ග මීටර එකසිය විසි හතරක් අඩංගු බිම් ප්‍රදේශය (124 S q.m.)

එකී සහාධිපත්‍ය කැබැල්ල ඔප්පු අංක Con E 11/74 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

සහාධිපත්‍ය දේපළේ පොදු පහසුකම් හි මෙම පාර්සල් කැබැල්ලේ නොබෙදූ කොටස් අගය 33 කි.

මෙම පාර්සල් කැබැල්ලට ආසන්නතම පොදු පිවිසුම් පෙදෙස CE F19/10 වේ.

උපාංග පාර්සල් කැබලි අංක A141 (වාහන නැවතීම් අංගනය) මෙම පාර්සල් කැබැල්ල සඳහා වෙන්කරනු ලබන අතර එය පහත සඳහන් පරිදි වේ.

උතුරට : Y/B, F0, F1/U1/A5,
නැගෙනහිරට : පාර්සල් කැබලි අංක A140,
දකුණට : CEF0/1,
බස්නාහිරට : CEF 0/1

Zenith :(උඩ අහස් මුදුන) මෙම පාර්සල් කැබැල්ලේ ඉහල මුහුණත,

Nadir: (යට අහස් මුදුන) මෙම පාර්සල් කැබැල්ලේ කොන්ක්‍රීට් පොළව.

වර්ග මීටර් එකසිය විසි පහක් අඩංගු බිම් ප්‍රදේශය (125 Sq.m)

එකී සහාධිපත්‍ය කැබැල්ල ඔප්පු අංක Con A 168/204 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන හියු අර්. සමරසිංහ විසින් සාදන ලද 1995 නොවැම්බර් 16 දාතම හා අංක 2289 දරන පිඹුරේ නිරූපිත ලොට් 07 (මාර්ග වෙන්කිරීම) දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ අයිතිය ද සමගය.

(උකස් බැඳුම්කර අංක 782 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-489

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.